*සැ. යු.* - 2013.11.15 වැනි දින පළවූ අංක 1837 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,838 - 2013 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2013.11.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1008 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1009 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1009 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 දෙසැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 නොවැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 354

DVF/RECT/284/04/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

(අ) කර්නල් ගෝනදුවගේ සිරිවර්ධන පෙරේරා (නි/2286) - 2013.06.26
(ආ) කර්නල් ධර්මකීර්ති හේරත් මුදියන්සේලාගේ වනිගරත්න බංඩා තම්මිට (නි/2552) - 2013.06.26
(ඇ) කර්නල් විජේසිංහ විදානලාගේ මර්වින් ගෙග්‍රරි රියෙන්සි පෙරේරා (නි/2408) - 2013.10.18

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

11-665

---

DVF/RECT/280/32/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙලීමක් සහ විශ්‍රාම ගැන්වීමක්

**නිල පහත හෙලීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2010 පෙබරවාරි මස 22 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයට නිල පහත හෙලීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික කර්නල් අකුරුගොඩ කළුආරච්චිලාගේ සුරවීර, ආර්එස්පී (නි/2308)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2010 පෙබරවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් කර්නල් අකුරුගොඩ කළුආරච්චිලාගේ සුරවීර, ආර්එස්පී (නි/2308)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 මැයි මස 21 වැනි දින,
කොළඹ දී ය.

11-664

---

2013 අංක 355

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරී 2010 අගෝස්තු මස 12 වැනි දින සිට ලුතිතන් කර්නල් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

තාවකාලික ලුතිතන් කර්නල් දොන් බන්දුල දූෂාන් විජේවික්‍රම, ගැහේබ (නි/2166)

**විශ්‍රාම ගැන්වීම**

පහත නම සඳහන් නිලධාරී 2010 අගෝස්තු මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් කර්නල් දොන් බන්දුල දූෂාන් විජේවික්‍රම, ගැහේබ (නි/2166)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

11-821

# රජයේ නිවේදන

## දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය

1965 අංක 03 දරන දුම්රිය දෛනික වැටුප් ලබන යහසාධක සංගම් පනතේ 30අ(1) ප්‍රකාර ක්‍රියාකාරී මණ්ඩලය අහෝසි කිරීම

වර්ෂ 2013 සැප්තැම්බර් මස 13 වැනි දින අංක 1828 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය කෙරෙහි අවධානය යොමු කරවමි.

"එහි සඳහන් ශීර්ෂය 1965 අංක 03 දරන දුම්රිය දෛනික වැටුප් ලබන සේවකයින්ගේ යහසාධක සංගම් පනතේ අංක 30අ(1) ප්‍රකාර ක්‍රියාකාරී මණ්ඩලය අහෝසි කිරීම යනුවෙන් හා පත්කරන ලද විශේෂ පරිපාලන කමිටුවේ යාන්ත්‍රික ඉංජිනේරු පී. ඒ. ක්‍රිශාන්ත මහතාගේ නම ජී. ඒ. ක්‍රිසන්ත මහතා ලෙස විය යුතු බව මෙයින් නිවේදනය කරමි.".

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

11-754

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නෙල්ලිඅඩි ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සිංගරාජා සුභරාජා සහ උමායියාල් සුභරාජා.

2013 සැප්තැම්බර් මස පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

"අන්නායිකොඩ්ඩේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ත්‍යාගරාජා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2011 පෙබරවාරි මස 02 වැනි දින සහතික කළ අංක 13913 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සිංගරාජා සුභරාජා සහ උමායියාල් සුභරාජා යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූහයලක්ෂ හැත්තෑඅටදහස් හැත්තෑහතරයි ශත තිස්තුනක (රු. 96,78,074.33) ක මුදලක් 2013 මාර්තු මස 06 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 96,78,074.33 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 මාර්තු 07 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 13913 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ හා කොට්ඨාසයේ වන්නාර්පොන්නෙයි වසමේ වන්නාර්පොන්නෙයි ඊසාන දිගින් පිහිටි "කට්ටලම්පුලම්" නමැති ඉඩම 3 එල්එම්එස් විසි සහ 2.7/10 කේඑල්එස් නමැති ඉඩමට මිනින්දෝරු ඒ. අරුල්නේසන් විසින් මැන සාදන ලද 2011 මැයි 02 දිනැති පිඹුරු අංක 1030 හි ලොට් 1 අනුව ඇති ප්‍රමාණයෙන් 3එල්එම්එස් විසි සහ 02.41 කේඑල්එස් ඉඩමට මායිම් වශයෙන් ද, නැගෙනහිරට : සිත්තම්පරපිල්ලගේ බිරිඳ වන සර්වේස්වරී සහ සීන්නතුරෙයි ගේ බිරිඳ වන රාජිණි සහ වෙනත් අයගේ දේපළ ද, උතුරට : තීරුකුමාරන්ගේ බිරිඳ වන රෙනුගා සහ ශ්‍රිකාන්ත ගේ බිරිඳ වන නන්දිනිගේ දේපළ ද, බස්නාහිරට : කන්දසාමි ගේ බිරිඳ වන විජයරාණිගේ දේපළ සහ දකුණට පටුමග මගින් ද ඉඩමට මායිම් වූ 3එල්එම්එස් විසි සහ 02.41 කේඑල්එස් විශාලත්වයෙන් වූ නිවාසය, ගහකොළ සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ ද සමග වේ.

මෙම මුළු ඉඩම එහි ඇති තුර්වෙයි ලිඳෙහි කොටසක් සහ ඉහත සඳහන් පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන මෙම ඉඩමට ජලය ගෙනෙන දිය ඇළ සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-721/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කිරුළපන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කොස්සිංහල විතානගේ රුවින් තිලන්ත බෝපිටිය, කොස්සිංහල විතානගේ රිෂාන්ති සමීතා බෝපිටිය සහ රොසානෝ ජොසෆ් ග්‍රැන්ඩ්

2013 සැප්තැම්බර් මස දින පවත්වන ලද හැටන් හැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2010 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1037 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කොස්සිංහල විතානගේ රුවීන් තිලන්ත බෝපිටිය කොස්සිංහල විතානගේ රිෂාන්ති සමීතා බෝපිටිය සහ රොසානෝ ජොසෆ් ග්‍රැන්ඩ් යන අය ණයකරුවන් ලෙස පැහැරර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටලක්ෂ හතලිස් හයදහස් දෙසිය අනූඑකයි ශත හැත්තෑඑක (රු.60,46,291.71) ක මුදලක් 2013 අගෝස්තු මස 29 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් 60,46,291.71 ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 අගෝස්තු මස 30 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1037 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.".

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුල තලවතුගොඩ පිහිටි කළල්ගොඩ 1 වන පටුමගේ වරිපනම් අංක 29ඒ දරන දෙල්ගහලන්ද සහ දොලේලන්ද දවටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ 1993 මාර්තු මස 12 වැනි දින සාදන ලද අංක 2820 දරන පිඹුරෙන් බෙදා වෙන්කළ ලොට් 20 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : මෙහි ලොට් 19 න් ද, නැගෙනහිරට : (වෙන් කරන ලද අඩි 15 ක් පළලැති පාරේ) මෙහි ලොට් 51 න් ද, දකුණට : මෙහි ලොට් 21 න් ද සහ බස්නාහිරට : මෙහි ලොට් 17 න් ද මායිම් වූ එකී අංක 2820 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1771/38 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කරන ලද මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුල තලවතුගොඩ පිහිටි කළල්ගොඩ 1 වන පටුමගේ වරිපනම් අංක 29ඒ දරන දෙල්ගහලන්ද සහ දොලේලන්ද දවටගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ 2010 ඔක්තෝබර් මස 17 වැනි දින සාදන ලද අංක 5912/9000 දරන පිඹුරේ ලොට් 20 ඒ වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට: ඩබ්. ටී. පී. සුමතිරත්නගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : අඩි 15 ක් පළලැති පාරෙන් (බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් පිළියෙල කරන ලද අංක 2820 දරන පිඹුරේ ලොට් 5) ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් පිළියෙල කරන ලද අංක 2820 දරන පිඹුරේ ලොට් 21න් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් පිළියෙල කරන ලද අංක 2820 දරන පිඹුරේ ලොට් 17 න් ද මායිම් වූ එකී අංක 5912/9000 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී අංක 1037 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ප්‍රවේශ මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-721/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. මාතලේ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

චමින්ද ජානක තුම්බෝවිල.

2013 සැප්තැම්බර් මස පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

"මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දා වූ ද 2010 ජූනි මස 23 වැනි දින සහතික කළ අංක 2044 (කොටසක්) සහ 2011 නොවැම්බර් මස 16 වැනි දින සහතික කළ අංක 2626 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම චමින්ද ජානක තුම්බෝවිල යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි පනස්නමදහස් තුන්සියඅසූහතයි ශත හතලිස්එකක (රු.10,059,387.41) මුදලක් 2013 මැයි මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 10,059,387.41 ක මුදල අය කර ගැනීම සඳහා සහ 2013 ජූනි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2044 සහ 2626 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩී. කෙලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේසිය පත්තුවේ වගාපනහ අඹුලුඹය ග්‍රාමයේ නොහොත් තීත්තවැල්ගොල්ලේ හි පිහිටි වම්බටුයාය පලුගහයාය, පලුකන්දයාය, ගලේයාය සහ කොස්වත්තමුල්ලේකුඹුර දැන් විජේසිරිවත්ත ලෙස හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් 2000 ජනවාරි මස 31 වැනි දින මැන සාදන ලද අංක 670 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 01 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස ද, නැගෙනහිරට : දඹුල්ලේ සිට කලුන්දාව

දක්වා වූ පාර ද දකුණට ඇල ද සහ බස්නාහිරට දඹුලුඹය ද මායිම් වූ රූඩ් දෙකක් පර්චස් විසි පහක (අ. 0, රූ, 2, පර්. 25) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ සියළුදේත් සමග වන මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඩී 470/10 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-721/3

---

## ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 මැයි 31 වැනි දින දී මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කර කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් ලිමිටඩ් යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සිසිල් පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1564 හා 2011 දෙසැම්බර් මස 22 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, තෝලංගමුව නුවර පාර, අංක ඩී 6/5ඒ දරන ස්ථානයේ "සඳකෙම අවුන" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරය කරගෙන යන දිසානායකගේ චින්තක ජයවිලාල් ප්‍රේමතිලක යන අය විසින් පැහැර ඇති හෙයින් ද,

2013 මාර්තු 31 වැනි දිනට ඉහත කී අංක 1564 දරන උකස් බැඳුම්කරය මත එකී දිසානායකගේ චින්තක ජයවිලාල් ප්‍රේමතිලක යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් හැටහත් ලක්ෂ අසූපන් දහස් හතලිස් හතරකුත් ශත පහක (රු. 67,85,044.05) මුදලක් සහ 2013 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ පනස් හත් දහස් තුන්සිය හැට හතරකුත් ශත හැට හතරක් (රු. 5,57,364.64) සඳහා වර්ෂයකට සියයට 32% බැගින් ගණන් බලනු ලබන පොළිය ද, රුපියල් පණස් අට ලක්ෂයක් (රු. 58,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැටහත් ලක්ෂ අසූපන් දහස් හතලිස් හතරකුත් ශත පහක (රු. 67,85,044.05) මුදල සහ 2013 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පන්ලක්ෂ පනස් හත් දහස් තුන්සිය හැට හතරකුත් ශත හැට හතරක් (රු. 5,57,364.64) සඳහා වර්ෂයකට සියයට 32% බැගින් ගණන් බලනු ලබන පොළිය ද, රුපියල් පණස් අට ලක්ෂයක් (රු. 58,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1564 දරන උකස් බැඳුම්කරයන් ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා වෙනත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1564 දරන උකස් බැඳුම්කරය මගින් එකී දිසානායකගේ චින්තක ජයවිලාල් ප්‍රේමතිලක විසින් ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 1564 දන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ, බෙලිගල් කෝරළේ, කීරවැලි පත්තුවේ, තෝලංගමුවේ පිහිටි"ගල්පිටියවත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. එන්. කල්දේරා මැන සකස් කළ අංක 3237/ඒ හා 1997.12.16 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලකුණු කළ බිම් කට්ටිය වූ රූඩ් එකකුත්, පර්චස් පහයි දශම තුනක් (අ. 0 රූ. 1 පර්. 5.3) බිම් ප්‍රමාණයෙන් යුක්ත වූ දැනට රූඩ් එකකුත් පර්චස් තුනයි දශම පහක් (අ. 0 රූ. 1 පර්. 3.5) බිම් ප්‍රමාණයෙන් යුක්ත බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ජී. අප්පුහාමිට අයිති පාලුවත්ත ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඩබ්ලිව්. ජී. එම්. මොහොට්ටි අප්පුහාමිට අයිති ගල්පිටියෙ ගලගාව වත්ත ද, දකුණට : කොළඹ මහනුවර පාර ද, බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බෑන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

11-727

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ඔක්තෝබර් මස 09 වැනි දින දී මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට මාතර ප්‍රසිද්ධ නොතාරිස් සේනක ආර්. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද අංක 747 හා 2011 ජූනි මස 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, "මහවෙල ෆැෂන් පැලස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ ව්‍යාපාරය කරගෙන යන තංගල්ලේ, ජගත් කීර්ති පරණගම නොහොත් ජගත් කීර්ති ද සිල්වා පරණගම නොහොත් පරණගමගේ ජගත් කීර්ති ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 ජූලි 31 වැනි දිනට ඉහත කී ජගත් කීර්ති පරණගම නොහොත් ජගත් කීර්ති ද සිල්වා පරණගම නොහොත් පරණගමගේ ජගත් කීර්ති ද සිල්වා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතලිස් ලක්ෂ පණස් අට දහස් එකසිය විසි තුනකුත් ශත අසූවක (රු. 40,58,123.80) මුදලක් සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් හය ලක්ෂ විසිහය දහස් හැට හතරක් (රු. 36,26,064) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින්, එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මාධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැදුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හතලිස් ලක්ෂ පණස් අට දහස් එකසිය විසි තුනකුත් ශත අසූවක (රු. 40,58,123.80) මුදලක් සහ 2013 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් හය ලක්ෂ විසි හය දහස් හැට හතරක් (රු. 36,26,064) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම් :

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතත ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට සියයට අටක (8%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර උකස් බැදුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා අංක 747 දරන උකස් බැදුම්කරය මගින් එකී ජගත් කීර්ති පරණගම නොහොත් ජගත් කීර්ති ද සිල්වා පරණගම නොහොත් පරණගමගේ ජගත් කීර්ති ද සිල්වා යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

#### අංක 747 දරන උකස් බැදුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, නාකුලුගමුවේ පිහිටි "සියඹලාගහවත්තලොට් බී" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ආර්. මාබරණ මැන සකස් කළ අංක 3524 හා 2003.05.16 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : වලේහේන සහ කෝන්ගහවත්ත ද, නැගෙනහිරට : දෙවට පාර ද, දකුණට : දික්වැල්ලේ සිට තංගල්ලට යන මහපාර සහ අංක 3524 පිඹුරේ ලොට් අංක 1 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A දරන බිම් කට්ටිය සහ අංක 3524 පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත අක්කර එකකුත්, රූඩ් එකකුත් , පර්චස් තිස්නවයක් (අ. 1, රූ. 1, පර්. 39) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ සම්පූර්ණ බිම් සහ එහි පිහිටි සියලු වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

11-728

---

## මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ජූනි මස 28 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල

රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2006.12.06 වැනි දින අංක 1441 සහ 2007.03.07 වැනි දින අංක 1616 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්,

1. මහදුරගේ චන්ද්‍රදාස මහතා,
2. මල්දෙණිය කංකානමලාගේ දයා මංගලිකා මිය

යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කරය මත රුපියල් තුන් ලක්ෂ පනස් දහසකුත් සත දහනවයක් (රු. 3,50,000.19) හා රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.02.16 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් තුන්ලක්ෂ පනස් දහසක් හා සත දහනවයක (රු. 3,50,000.19) මුදලකට ද, 2010.06.07 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් හා සත දහනවයක (රු. 3,50,000.19) මුදල හා රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1441 හා 1616 දරන උකස් බැඳුම්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

*උකස්කර අංක 1441 දරන දේපළ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, සීතාවක පුර නගර සභා සීමාව තුළ උක්වත්ත ග්‍රාමයේ පිහිටි, "හොනිටන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. පී. ජයලත් කුමාර මහතා විසින් මැන සාදන ලද අංක 103 දරන පිඹුරේ ලොට් 01 සඳහා මායිම්, උතුරට : කැබලි අංක 141 ද, නැගෙනහිරට : කැබලි අංක 59 ද, දකුණට : කැබලි අංක 143 ද, බස්නාහිරට : මාර්ගය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 30.5) ක් විශාල ඉඩම වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හේවාගම් කෝරළයේ උඩුගහපත්තුවේ අවිස්සාවේල්ල නගර සභා සීමාව තුළ අවිස්සාවේල්ල නගර සභා අංක 08 දරන කොට්ඨාසයේ අවිස්සාවේල්ල කොළඹ පාරේ, පිහිටා තිබෙන බලයලත් මානක ඇස්. ආර්. යාපා මහතා විසින් 1958 නොවැම්බර් මස 18 වැනි දින මැන සකස් කරන ලද අංක 1006 දරන පිඹුර මගින් බෙදා වෙන් කරන ලද "හොනිටන් එස්ටේට්" නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අංක 10 දරන බිම් කබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 09 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 11 දරන කැබැල්ල ද, බස්නාහිරට : ඇල ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දහසය (අ. 0, රූ. 0, පර්. 16) ක් විශාලත්වය ඇති වරිපනම් අංක 216/6 දරන ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේ වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 131/147 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
(කොළඹ පිටත).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත, මහජන බැංකුව
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

11-798

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ටී. එම්. එස්. බණ්ඩා.
ගිණුම් අංක : 0031 5001 0631.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2013 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. බන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2008 මාර්තු මස 13 දාතම හා අංක 903 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තෙන්නකෝන් මුදියන්සේලාගේ සුමතිරත්න බන්ඩා යන යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 903 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් හත් ලක්ෂ තිස්අට දහස් එකසිය හතලිස් එකයි ශත විසි තුනක (රු. 37,38,141.23) මුදලක් 2013 අගෝස්තු මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්හත් ලක්ෂ තිස්අට දහස් එකසිය හතලිස් එකයි ශත විසි තුනක (රු. 37,38,141.23) මුදල ද 2013 අගෝස්තු මස 28 දින සිට අංක 903 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් හතර ලක්ෂ විසිපන් දහස් හයසිය අසූඑකයි ශත අනූ පහක (රු. 34,25,681.95) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 903 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාවන් තුළ මොරටුවැල්ල පිහිටි ෆ්‍රේසර් ඇවනිව් වරිපනම් අංක 27 දරන "පයුරුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඕ. ජේ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1991 ජූලි මස 26 දාතම හා අංක 3597 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ෆ්‍රේසර් ඇවනිව්, නැගෙනහිරට : වරිපනම් අංක 25 දරන පරිශ්‍රයන්, දකුණට :එම ඉඩමේ ලොට් 1B සහ බස්නාහිරට : බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3හි මාර්ග පිවිසුම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 11.65) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3597 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3126/01 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ඒ දිගේ ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M915/52 යටතේ ලියාපදිංචි කොට ඇති හා බලයලත් මානක තැන ටී. සී. ආර්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1969 මාර්තු මස 11 දාතම හා අංක 22 දරන පිඹුරේ ලොට් 3.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

11-816/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2013.07.15 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0120-32415986-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් තිලනි පී. කරුණාසේකර විසින් සහතික කරන ලද 2010 ජූලි මස 01 දිනැති අංක 1481 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම වාද්දුව පදිංචි කපුසිකුගේ නිලූනිකා උපේකා විරානි ප්‍රනාන්දු සහ කලුහෙන්නදිගේ අනුර ඉන්දුක ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑඅටලක්ෂ හතලිස් තුන්දහස් එකසිය එකයි ශත හතලිස් තුනක (රු. 78,43,101.43) මුදලක්, 2012 ඔක්තෝබර් මස 19 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රු. 78,43,101.43 මුදලද, 2012 ඔක්තෝබර් මස 20 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් ඇත්නම් එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1481 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර සල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. එස්. සී. විතාන විසින් සාදන ලද 2009.09.11 දිනැති අංක 3206 දරන සැලැස්මේ නිරූපනය වන හීන්ඉරවල්ල හෙවත් ඉරවල්ල සහ දංගහකුඹුර සහ අරබ්බොඩ කුරුඳුවත්තේ ලොට් 1ඒ නමැති, ගොඩනැගිලි ගස්, වගා, බිම් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2005/504 සැලැස්මේ සඳහන් ලොට් ඩී1 ද, නැගෙනහිරට : අංක 2005/504 සැලැස්මේ සඳහන් ලොට් ඩී1 සහ ආර්1 ද, දකුණට : අංක 2005/504 සැලැස්මේ සඳහන් ලොට් 5 සහ බස්නාහිරට : පෙදරේරු කාණුව ද යන මායිම් තුළ එකී අංක 3206 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 16.10) ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එෆ් 584/216හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 3206 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ ලකුණු කළ එකී ඉඩම් කොටස පහත විස්තර කරනු ලබන ඉඩම්වල නැවත මැනීමක් සහ එකතුවක් වේ.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.12.06 දිනැති අංක 2005/504 දරන සැලැස්මේ නිරූපනය වන හේන්ඉරවල්ල හෙවත් ඉරවල්ල ලොට් සී සහ දංගහකුඹුර සහ අරම්බොඩ කුරුඳුවත්ත ලොට් 1ඒ නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.10.27 දිනැති අංක 2005/455 සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 7 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 ද, දකුණට : ලොට් 5 සහ බස්නාහිරට : පෙදරේරු කාණුව ද යන මායිම් තුළ එකී අංක 2005/504 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 8.10)ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එෆ 584/127හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.12.06 දිනැති අංක 2005/504 දරන සැලැස්මේ නිරූපනය වන හේන්ඉරවල්ල හෙවත් ඉරවල්ල ලොට් සී සහ දංගහකුඹුර සහ අරබ්බොඩ කුරුඳුවත්ත ලොට් 1ඒ නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.10.27 දිනැති අංක 2005/455 සැලැස්මේ නිරූපනය වන ලොට් ඒ හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් 7 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඩී1 ද, නැගෙනහිරට : ලොට් ඩී1 සහ ආර්1 ද, දකුණට : ලොට් 6 සහ බස්නාහිරට : පෙදරේරු කාණුව ද යන මායිම් තුල එකී අංක 2005/504 දරන සැලැස්ම අනුව පර්චස් අටක් (අ. 0. රූ. 0, පර්. 8)ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 584/201හි ලියපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එයට අදාළ වෙනත් පොදු අයිතීන් සමග.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.12.06 දිනැති අංක 2005/504 දරන සැලැස්මේ නිරූපනය වන හේන්ඉරවල්ල හෙවත් ඉරවල්ල ලොට් සී සහ දංගහකුඹුර සහ අරබ්බොඩ කුරුඳුවත්ත ලොට් 1ඒ නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.10.27 වැනි දිනැති අංක 2005/455 සැලැස්මේ නිරූපනය වන ලොට් ඒහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් ඩී1 (කාණුව සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 9407 සැලැස්මේ ලොට් ඩී ද, නැගෙනහිරට : ලොට් 1 ද, දකුණට : ලොට් ආර් 1 සහ 7 සහ බස්නාහිරට : ලොට් 7 සහ පෙදරේරු කාණුව ද යන මායිම් තුළ එකී අංක 2005/504 දරන සැලැස්ම අනුව පර්චස් දශම හතරයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 0.42) ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 574/39හි ලියපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.12.06 වැනි දිනැති අංක 2005/504 දරන සැලැස්මේ නිරූපනය වන හේන්ඉරවල්ල හෙවත් ඉරවල්ල ලොට් සී සහ දංගහකුඹුර සහ අරබ්බොඩ කුරුඳුවත්ත ලොට් 1ඒ නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු සේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.10.27 වැනි දිනැති අංක 2005/455 සැලැස්මේ නිරූපනය වන ලොට් ඒහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් ඩී2 (කාණුව සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් ආර් 1 ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : පෙදරේරු කාණුව ද යන මායිම් තුළ එකී අංක 2005/504 දරන සැලැස්ම අනුව පර්චස් දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 0.28)ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 571/22හි ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය උතුර පිහිටි බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.12.06 දිනැති අංක 2005/504 දරන සැලැස්මේ නිරූපනය වන හේන්ඉරවල්ල හෙවත් ඉරවල්ල ලොට් සී සහ දංගහකුඹුර සහ ආරබ්බොඩ කුරුඳුවත්ත ලොට් 1ඒ නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ (බලයලත් මිනින්දෝරු එන්. හේරත් විසින් සාදන ලද 2005.10.27 දිනැති අංක 2005/455 සැලැස්මේ නිරූපනය වන ලොට් ඒහි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් ආර්1 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 7, ඩී1 සහ 1 ද, නැගෙනහිරට : ලොට්ස් 2, 3, 4 අංක 9407 සැලැස්මේ ලොට් ඩී සහ පාර (යූ. සී.) ද, දකුණට : පාර (යූ. සී.) සහ මෙම ඉඩමේ ලොට් 2 සහ බස්නාහිරට : ලොට්ස් ඩී2, 5, 6 සහ 7 යන මායිම් තුළ එකී අංක 2005/504 දරන සැලැස්ම අනුව පර්චස් දොළහයි දශම අටයි තුනක් (අ. 0, රූ. 0, පර්. 12.83) ක් විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 571/21හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනි-නීති.

11-771/2

---

## ලංකා බැංකුව - පැලියගොඩ අධිශ්‍රේණී ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.11.01 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2007.04.05 වැනි දිනැති අංක 4838 දරන උකස් බැඳුම්කරයට අනුව 2013.09.13 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් එක්කෝටි විසි ලක්ෂ පනස් හත් දහස් දෙසීය විසි දෙකයි ශත හතක (රු. 12,057,222.07) මුදල සමග රුපියල් එක්කෝටි දොළොස් ලක්ෂ හැට තුන් දහස් නවසිය විසි දෙකයි ශත තිහක (රු. 11,263,922.30) මුදල මත වසරකට සියයට දොළහ (12%) බැගින් පොළියක් 2013.09.14 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කඩවත, මහර, පහළ බියන්විල, නුවර පාරේ අංක 190/02 හි පදිංචි නාඋල්ලගේ ප්‍රියන්ති ලංකා පෙරේරා මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එස්. සී. මැතිව් විසින් සහතික කරන ලද 2007.04.05 වැනි දිනැති එකී අංක 4838 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් එක්කෝටි විසිලක්ෂ පනස් හත් දහස් දෙසීය විසි දෙකයි ශත හතක (රු. 12,057,222.07) මුදල සමග 2013.09.14 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3හි ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පැලියගොඩ අධිශ්‍රේණී ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ. සියනෑ කෝරලයේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (කඩවත උප කාර්යාලයේ) පහළ බියන්විල පිහිටි නුවර පාරේ, වරිපනම් අංක 170/34 දරන " මකුළුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 08 දිනැති අංක 6450 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඊසානදිගට : අංක 6451 දරන පිඹුරෙහි ලොට් 1 සහ 3 ද, ගිනිකොණට : අංක 6451 දරන පිඹුරෙහි ලොට් 3 සහ 2 ද, නිරිතදිගට : ජී. ඩී. මෙන්ඩිස් අප්පුහාමි උරුමකම් කියන ඉඩම ද, වයඹට : අංක 6443 දරන පිඹුරෙහි ලොට් 2 ද මායිම්ව එකී අංක 6450 දරන පිඹුරට අනුව පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ ආදී සියලු දේද සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C504/283හි ලියාපදිංචි කර ඇත.

එකී පහළ බියන්විල පිහිටි නුවර පාරේ, වරිපනම් අංක 170/34 දරන "මකුළුගහවත්ත නමැති ඉඩමෙහි එකී අංක 6450 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා ඇති සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 ඊසානදිගට : අංක 6451 දරන පිඹුරෙහි ලොට් 2 සහ 3 ද, ගිනිකොණට : ජී. ඩී. මෙන්ඩින් අප්පුහාමි උරුමකම් කියන ඉඩම ද, නිරිතදිගට : ජී. ඩී. මෙන්ඩින් අප්පුහාමි උරුමකම් කියන ඉඩම ද සහ වයඹට : අංක 6451 දරන පිඹුරෙහි ලොට් 1 හා 3 ද මායිම්ව එකී අංක 6450 දරන පිඹුරට අනුව පර්චස් දොලහක (අ. 0, රූ. 0, පර්. 12) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහ කොළ සහ සියලු දේද සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C504/284හි ලියාපදිංචි කර ඇත.

එකී පහළ බියන්විල පිහිටි "මකුළුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 08 වැනි දිනැති අංක 6451 දරන පිඹුරෙහි ලොට් 3 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් ලොට් 3, ඊසානදිගට : අංක 6452 දරන පිඹුරෙහි ලොට් 27 ද, ගිනිකොණට : එකී අංක 6451 දරන පිඹුරෙහි ලොට් 2 සහ 6450 දරන පිඹුරෙහි ලොට් 2 ද, නිරිතදිගට එකී අංක 6451 දරන පිඹුරෙහි ලොට් 2 සහ අංක 6450 දරන පිඹුරෙහි ලොට් 1 ද, වයඹට : ලොට් 1 සහ අංක 6450 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම්ව එකී අංක 6451 දරන පිඹුරට අනුව පර්චස් තුනක (අ. 0, රූ. 0, පර්. 3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C504/51හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 8 වැනි දිනැති අංක 6452හි ලොට් 27 සහ 28 ලෙස දක්වා නිරූපණය කර ඇති පාරට වෙන් කළ කොටස් මතින් සහ ඒ දිගට පාරේ අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ටී. ගමගේ,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
පෑලියගොඩ අධිශ්‍රේණි ශාඛාව.

11-769

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

සංශෝධනය කිරීමක් පිළිබඳ දැන්වීම

ණය අංකය : P020000001.
ණයකරුගේ සම්පූර්ණ නම : රාජගුරු මුදියන්සේලාගේ ජයතිලක.

2012.08.10 දින අංක 1771 දරන *ගැසට්* පත්‍රයේ පළවූ යෝජනා සම්මුතිය පළ කිරීමට අදාලව කැබලි අංක 02, 03, 04, 07, 10 සහ 11ට අදාල උපලේඛනයෙහි පැවති කැබලි අංක 07ට අදාළ උපලේඛනය ද එම කැබලි අංක 07 කොටස අදාල යෝජනා සම්මුතිය පළ කිරීම සඳහා අදාළ නොවන බැවින් එය ඉවත් කර සංශෝධනය කරන බව මෙයින් දන්වා සිටිමු.

සාමාන්‍යාධිකාරී.

2013 නොවැම්බර් මස 08 වැනි දින,
ශ්‍රී. ල. නි. ස. මූ. සං. බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

11-840

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පී කිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 සැප්තැම්බර් මස 20 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0130 - 32531087-101

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සහතික කරන ලද 2011 පෙබරවාරි මස 10 දිනැති අංක 1857 දරන බැදුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කඩවත පදිංචි බටබැදිගේ දොන් චාලක නාවින්ද වික්‍රමසූරිය යන අය බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් පනස්හයලක්ෂ අනූහයදහස් හත්සිය හතයි ශත විසි එකක (රු. 5,696,707.21) මුදලක් 2013 මැයි 3 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,696,701.21 මුදල ද, 2013 මැයි 4 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට තිස්එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක

1857 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අධිකාරී පත්තුවේ සියනෑ කෝරළේ බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාකොළ උප කාර්යාල ප්‍රදේශය තුළ මාකොළ දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමරත්න විසින් සාදන ලද 2010.08.13 වැනි දිනැති අංක 146/2010 දරන සැලැස්මේ නිරූපනය වන ගොඩපරගහවත්ත නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු ඩී. සී. එම්. එස්. විමරත්න විසින් සාදන ලද 2005.09.15 දිනැති අංක 240/2005 සැලැස්මේ නිරූපනය වන ලොට් 3 හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) ලොට් 3 සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 3 ඒ සහ 3 බී ද, නැගෙනහිරට ලොට් 3 බී ද දකුණට : කුඹුර සහ බස්නාහිරට : අංක 1/81 සැලැස්මේ සඳහන් ලොට් 1 (මීටර් 5ක් පළල පාර) යන මායිම් තුළ පර්චස් විසි අටයි දශම පහයි හයක් (අ. 0 රූ. 0 පර්. 28.56) විශාල, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ලොට් 3 සී පහත විස්තර කරනු ලබන ඉඩමෙන් අතුරු බෙදීමක් වේ.

පෙර කී මාකොළ දකුණ පිහිටි ගොඩපරගහවත්ත නමැති ඉඩමේ (බලයලත් මිනින්දෝරු ඩී. එම්. අලහකෝන් විසින් සාදන ලද 1922.09.19 දිනැති සැලැස්මේ නිරූපනය වන ඉතිරි ඉඩම් කොටසක පවත්නා මායිම් මත නැවත මනින ලද සහ අතුරු බෙදීමක් වන) ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 8 ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : කුඹුර සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 1981.01.23 දිනැති අංක 1/81 සැලැස්මේ සඳහන් ලොට් 1 (මීටර් 5 ක් පළල පාර) යන මායිම් තුළ රූඩ් එකයි පර්චස් දහයයි දශම හතයි හයක් (අ. 0, රූ. 1, පර්චස් 10.76) විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 958/22 හි ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන පරිදි මාර්ග අයිතිය සමග.

පෙර කී මාකොළ දකුණ පිහිටි ගොඩපරගහවත්ත නැමති ඉඩමේ (බලයලත් මිනින්දෝරු ඩී. එම්. අලහකෝන් විසින් සාදන ලද 1922.09.19 දිනැති සැලැස්මේ නිරූපනය වන ඉතිරි ඉඩම් කොටසක පවත්නා මායිම් මත නැවත මනින ලද සහ අතුරු බෙදීමක් වන) ලොට් 8 ලකුණු කළ (පාර සඳහා වෙන් කරන ලද) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : කුඹුර සහ ලොට් 6, 5, 4 සහ 3 සහ බස්නාහිරට : ලොට් 6 සහ බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද 1981.01.23 දිනැති අංක 1/81 සැලැස්මේ සඳහන් ලොට් 1 යන මායිම් තුළ පර්චස් විසි අටක් (අ. 0 රූ. 0 පර්චස් 28) විශාල ඉඩම, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 958/ 23 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11-771/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.